# සුදු කොඩි හා සුදු නෙළුම්

සුදු නෙළුම් ගෙන අවලම් තවලම් ගිය අය සුදු කොඩි ගෙන මරණයට ගියේ යැයි කියන අය ගැන කඳුළු සලති. ඔවුන්ට නම් සැබවින්ම කඳුළු සැලීමට හේතුවක් ඇත. ඔවුන් සුදු නෙළුම් ගෙන අවලම් තවලම් ගියේ ප්‍රභාකරන් ජීවත් කරවීමට ය. ඔහු සමග ඊනියා සාම සාකච්ඡා ඇති කිරීමට ය. එබැවින් ප්‍රභාකරන්ගේ මිනීමරු ත්‍රස්තවාදීන් සුදු කොඩි ගෙන ජීවිත දානය පතා පැමිණියේ යැයි කියන විට ඔවුන්ට අභය දානය දිය යුතු යැයි සුදු නෙළුම් ගත්තන් සිතනවා විය හැකි ය. සුදු නෙළුමන් කඳුළු සලන්නේ මිනීමරු ත්‍රස්තවාදීන්ට ජීවිත දානය නොදුන්නේ යැයි කියන බැවිනි.

සුදු කොඩි පිළිබඳ කතාව දැන් ලෝ පුරා සාකච්ඡා වෙයි. බටහිර ජනමාධ්‍යවලට මේ තළු ගසමින් සති ගණනක් කතාකළ හැකි මාතෘකාවකි. මිනීමරුවන්ගේ මානව අයිතිවාසිකම් බටහිරයන්ගේ ඇස්වලට ද කඳුලු ගෙන එයි. එහෙත් ඒ සෑම මිනීමරුවකු ගැන ම නොවේ. ඔවුන් වෙනුවෙන් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියේ පැවැත්ම වෙනුවෙන් මිනීමැරුවන්ට පමණක් මානව අයිතිවාසිකම් වෙයි. ඔවුන්ගේ සංස්කෘතියට එරෙහිව මිනීමරණ ඇෆ්ගනිස්තාන කැරලිකරුවන්ට මානව අයිතිවාසිකම් නො මැත. එවැන්නන් බල්ලන් මෙන් මරාදැමුව ද ප්‍රශ්නයක් නැත. අප බොහෝ අවස්ථාවල දී පෙන්වා දී ඇත්තේ බටහිරයන්ගේ මානව අයිතිවාසිකම් අර්ථ දැක්වෙන්නේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට සාපේක්ෂව බව ය.

සුදු කොඩි කතාව ඇද ගත්තේ ඒ ජා පෙරමුණේ හා ජ වි පෙරමුණේ අපේක්ෂකයා වූ සරත් ෆොන්සේකා මහතා ය. පසුගිය ඉරිදා සන්ඩේ ලීඩර් පුවත්පතේ ප්‍රධාන ප්‍රවෘත්තියට අනුව සුදුකොඩි ගෙන ජීවිතදානය ඉල්ලමින් පැමිණි පිරිසකට ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අණක් අනුව වෙඩි තබා ඇත. ෆොන්සේකා මහතා මේ ඊනියා තොරතුර හෙළිදරව් කර ඇත්තේ මෙරට ඡන්දදායකයන්ට නො වේ. ඔහුගේ ඒ ප්‍රකාශය පැහැදිලි ව ම බටහිරයන්ට හා ඔවුන්ගේ අනුගාමිකයන්ට ය. ඒ ප්‍රකාශය යුද්ධ අපරාධ අධිකරණයක ගොනු කර ගත හැකි සාක්ෂියක් ලෙස පමණක් වැදගත් ය. ඒ ප්‍රකාශයෙන් සිදු වී ඇත්තේ යුද්ධ අධිකරණයක ඉදිරිපත් කිරීමට සාක්ෂියක් ලබා දීම ය. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා හා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා ඊනියා යුද්ධ අපරාධ අධිකරණයක් වෙත ගෙන යෑමට බටහිර රාජ්‍ය නායකයන්ට දොළදුකක් ඇත. ඔවුන් ක්‍රියාකරන්නේ ඒ දොළදුක සංසිඳුවා ගැනීමට ය. ඔවුන්ට මේ ජනාධිපතිවරණය යනු යුද්ධ අපරාධ පිළිබඳ ඊනියා තොරතුරු ලබාගැනීමට හා ජ වි පෙ ලවා රට අවුල්කිරීමට යොදාගන්නා මාධ්‍යයක් පමණකි. ජනාධිපතිවරණයෙන් මහින්ද රාජපක්ෂ මහතා පැරදවිය නොහැකි බව ඔවුහු දනිති. එබැවින් වෙනත් ක්‍රම ඔස්සේ රාජපක්ෂ මහතා ඉවත්කිරීම ඔවුන්ගේ උපාය වී ඇත.

ලංකාව පිළිබඳ පසුගිය දා නිකුත් වූ ඇමරිකානු වාර්තාවෙන් ඔවුන් අප රට ගැන ඇති කරගෙන තිබූ ස්ථාවරය වෙනස් වී ඇති බව පෙනේ යැයි ඇතැම්හු කියති. එහෙත් ඒ එසේ නො වේ. ඔවුන් කරන්නේ එක් පැත්තකින් ගත්කල කපන්නට බැරි අත සිඹිමකි. අනෙක් පැත්තෙන් ඉරානය, චීනය, මියන්මාරය ආදී රටවල් සමග ලංකාව පවත්වාගෙන යන සම්බන්ධය ඇමරිකාවේ සැලකිල්ලට යොමු වී ඇත. හැකිනම් ලංකාව ඒ රටවල් සමග ඇති සම්බන්ධය දුර්වල කර තමන් වෙතට නම්මා ගැනීමට ඇමරිකාව ක්‍රියා කරයි. එහෙත් ඒ අතර ඔවුහු දිගට ම දෙමළ ජාතිවාදයට අනුග්‍රහ දක්වති. බ්ලේක් ජනාධිපතිතුමා හමු වී අවස්ථාවේ දී පැහැදිලි ව ම ඒ පිළිබඳ ප්‍රශ්න කර ඇත. එමෙන් ම හදිසි නීතිය ඉවත්කරන ලෙසට ද ඔහු කියා ඇත. අපට ඔහුගෙන් ඇසීමට ඇත්තේ එක් ප්‍රශ්නයක් පමණකි. ඇමරිකාවේ අභ්‍යන්තර ප්‍රශ්න ගැන ඔබාමා හමු වී උපදෙස් දීමට මෙරට විදේශ අමාත්‍යාංශයෙන් නිලධාරියකු එවිය හැකි ද යන්න ඒ ප්‍රශ්නය වෙයි. ඇමරිකාවේ ලොකුකම ශක්තියක් ලෙස සලකන්නේ ඇමරිකන් විශ්වවිද්‍යාලවලින් හා ඇමරිකන් ශිෂ්‍යත්වවලින් එහාට ලෝකයක් නැති මෙරට නිවට උගතුන් පමණකි. කසිකබල් උගතකු නොවූ මහින්ද රාජපක්ෂ මහතා බ්ලේක්ට කතාකරන්නේ කෙසේ දැයි දනියි.

සරත් ෆොන්සේකා මහතා සුදු කොඩි ගැන කළ ප්‍රකාශය පළවූයේ සන්ඩේ ලීඩර් පත්‍රයෙහි ය. එහි කතුවරයාව සිටි ලසන්ත වික්‍රමතුංග මහතාගේ ඡායාරූපයකට ෆොන්සේකා මහතා පසුගිය දා මල්මාලයක් පැළඳවීය. ඒ පුවත්පත ආණ්ඩුවට හිතවත් පුවත්පතක් නො වේ. ඔවුන්ට සරත් ෆොන්සේකා මහතා අමාරුවේ දැමීමට පුවතක් පළකිරීමට අවශ්‍ය නො වේ. හැරත් ඒ පුවත පළවු පසුගිය ඉරිදා සවස පැවැත්වූ පුවත්පත් සාකච්ඡාවක දී ද ඒ පුවත වැරදි යැයි

© Prof. Nalin De Silva

ෆොන්සේකා මහතා නො කීවේ ය. ඔහු කලබල වී පුවත වැරදි යැයි කීමට පටන් ගත්තේ පසුදින සිට ය. ඒ පුවත බටහිරයන්ට නම් කදිම ඊනියා තොරතුරක් ලබා දී තිබුණි.

මේ පුවත සම්බන්ධයෙන් ප්‍රශ්න කිහිපයක් ඇසිය හැකි ය. සුදු කොඩි ගත් පමණින් මිනීමරුවෝ උපාසකයෝ නො වෙති. ඔවුන්ට වෙඩි තැබීමට අණ දුන්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් යැයි සිතමු. ෆොන්සේකා මහතා ඒ අණ පිළිපැද්දේ ඇයි? එසේත් නැතහොත් තමා යටතේ සිරින නිලධාරියකුට ඒ අණ පිළිපැදීමට ඉඩ දුන්නේ ඇයි? ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ජනාධිපතිතුමාගේ සොහොයුරකු වුව ද ඔහුට අණ දීමට බලයක් නැත. ඔහු දෙන අණක් නීති විරෝධී වෙයි. නීති විරෝධී අණක් ක්‍රියාත්මක කිරීමට ඉඩ දීමෙන් සරත් ෆොන්සේකා මහතා හමුදාපති ලෙස තදබල වරදක් කර ඇත. ඒ අණ නීති විරෝධි බව දැන දැන ම ක්‍රියාත්මක කිරීමට ඉඩදුන් ෆොන්සේකා මහතා ඇමරිකානුවන් ඇතුළු බටහිරයන්ගේ, සුදු නෙලුමන්ගේ හා දෙමළ ජාතිවාදීන්ගේ ඇසින් යුද්ධ අපරාධකරුවෙක් වෙයි.

එහෙත් ඔහු අපට නම් යුද්ධ අපරාධකරුවෙක් නො වෙයි. ආරක්ෂක ලේකම්වරයා ඒ අණ දුන්නේ නම් ඔහු ද යුද්ධ අපරාධකරුවෙක් නො වෙයි. පළමුවෙන් ම මෙරට යුද්ධයක් නොතිබිණි. මෙහි තිබුණේ බටහිරින් අනුග්‍රහය ලැබූ රජයට විරුද්ධ ව බටහිරයන් දුන් ආයුධ අතට ගත් බෙදුම්වාදී ත්‍රස්තවාදී කණ්ඩායමක් මැඩලීමට හමුදා මෙහෙයවීමක් පමණකි. පාතාලයට විරුද්ධව කරන පොලිස් මෙහෙයුම් හා කොටින්ට එරෙහි ව කළ හමුදා මෙහෙයුම් අතර විශාල වෙනසක් නැත. සුදු කොඩි රැගෙන ආවේ යැයි කියන ත්‍රස්තවාදීන් බෝම්බ බැඳගත් ත්‍රස්තවාදීන් නොවී යැයි කල් ඇතිව නිශ්චිතව කීමට හැකියාව තිබුණේ මොන ඇමරිකානුවාට ද? මොන පඬියාට ද? ඔවුන් මරණයට පත්වීමෙන් පසු ඔවුන් බෝම්බ බැඳගෙන නොතිබූ බව හෙළිවන්නට ඇත. එහෙත් ප්‍රශ්න වනුයේ මරණයට පෙර ඒ බව දැනගැනීමේ ක්‍රම වේදයක් පඬියන්ට හා බීබීසී සී එන් එන් ආදී ජනමාධ්‍යවලට තිබිණි ද යන්න ය.

සුදු කොඩි රැගෙන එන ඇෆ්ගන් කැරලිකරුවන්ට ඇමරිකානුවන් කෙසේ සලකනු ඇත් ද? ඇමරිකාව ජපානයට පරමාණු බෝම්බ හෙළුවේ ජපානය යුද්ධය පැරදීමෙන් පසුව ය. එහි දී ඇමරිකානුවන් පිළිපැදි ඊනියා ජාත්‍යන්තර නීතිය හෝ ගිවිසුම හෝ කුමක් ද? අපි ඒ සියල්ල පසෙකින් තබමු. රෝහණ විජේවීර මරා දමනු ලැබුයේ අත් අඬංගුවට ගැනීමෙන් පසුව ය. එයට වගකිවයුත්තේ රන්ජන් විජේරත්න හා රනිල් වික්‍රමසිංහ බව ජ වි පෙ ප්‍රකාශ කර ඇත. එදා ඇමරිකානුවන්ට අනෙක් බටහිරයන්ට හා මානව හිතවාදී පඬියන්ට ඊනියා ජාත්‍යන්තර ගිවිසුම් මතක් වුයේ නැත්තේ ඇයි? විජේවීර සිංහල වීම නිසා ද? නැත්නම් මාක්ස්වාදී වීම නිසා ද? එසේත් නැත්නම් ඒ දෙකම නිසා ද? ගමනායක මරාදමනු ලැබුයේ ද අත් අඬංගුවට හැනීමෙන් පසුව බව අද ඒ ජා පක්ෂයේ හා ඇමරිකාවේ තුරුල්ලට ජ වි පෙ මෙහෙයවන අනුර කුමාර දිසානායකට හෙවත් එදා කැලණිය සරසවියේ විද්‍යා පීඨයේ ජ වි පෙ ආධිපත්‍යය වෙනුවෙන් ක්‍රියාත්මක වූ අරවින්දට අමතක ද?

ඊනියා ජාත්‍යන්තර නීති යනු කබරගොයා තලගොයා බවට පත්කර ගැනීමට තිබෙන නීති මිස පිළිපැදීමට ඇති නීති නො වේ. අප සැමදාමත් කියා ඇත්තේ බටහිරයන්ගේ මානව අයිතිවාසිකම් ඇත්තේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියේ ආරක්ෂකයන්ට හා ඒ වෙනුවෙන් පෙනී සිටින්නන්ට මිස අනෙක් අයට නොවන බව ය. දේශපාලනයේ දී හෙළුවෙන් යන සුදු නෙළුමන්ට සුදු කොඩිය ඊනියා ජාත්‍යන්තර කබරගොයි නීතියේ මහා සංකේතයක් විය හැකි ය. සරත් ෆොන්සේකා යොදාගෙන ආරක්ෂක ලේකම්තුමාට හා ජනාධිපතිතුමාට විරුද්ධව යුද්ධ අධිකරණයේ නඩු පැවරීමට ඇමරිකානුවන්ට අනෙක් බටහිරයන්ට දේශපාලනයේ නන්නත්තාර වී ඇති රනිල්ට මංගලට හා අනුර කුමාරට අවශ්‍ය වී ඇත. අපට මේ සියල්ලන්ට ම පිළිතුරු දිය හැකි ක්‍රමයක් වෙයි. ඊනියා ජාත්‍යන්තර අධිකරණයේ කබරගොයි නීතිවලින් අපට වැඩක් නැත. බටහිර ගැති පඬියන් කුමක් කීවත් අපි මේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි නීතිවලට අවනත නො වෙමු. සුදු කොඩි කාරයන්ට වෙඩි තිබ්බේ ද නැත් ද යන්න අපට ප්‍රශ්නයක් නො වේ. සුදු කොඩි තිබුණත් නැතත් ඔවුන්ට වෙඩි තබා ත්‍රස්තවාදය අවසන් කිරීමත් ත්‍රස්තවාදය අවසන් කිරීමට දෙන ලද දේශපාලන නායකත්වයත් අප අනුමත කරන බව බටහිරයන්ටත් සුදු නෙළුමන්ටත් පඬියන්ටත් ජනාධිපතිවරණයේ දී පෙන්වා දෙමු. පාපී දෑත්වලින් ගත් සුදු නෙළුම මෙන් ම සුදු කොඩිය ද අපවිත්‍ර වන බවත් පාපය ද සාපේක්ෂ බවත් පමණක් මෙහි දී මතක් කරමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva